WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

2018.12.11/ 1315 - 1515

චිත්‍ර II
சித்திரம் II
Art II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**සැලකිය යුතුයි :**

* ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ භාවිත කළ හැකි ය.
* සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

* ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

  1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.
  2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිත කරන්න.

* **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

* ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

  - **රේඛා අධ්‍යයනය**

    1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

  - **වර්ණ චිත්‍රය**

    2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම
    3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
    4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම
    5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
    6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

WWW.OLEVELAPI.COM

**සැලකිය යුතුයි:**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නො වේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

OL/2018/43-S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**43 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

2018.12.11 / 0945 - 1145

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**සැලකිය යුතුයි :**

* ඔබ ඇඳිය යුත්තේ **එක** චිත්‍රයක් පමණි.
* ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
* ඇඳීමේ සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

---

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. පෙරහැරේ අලි කුලප්පුවක්
2. නිවසේ පැවැත්වෙන ආගමික කටයුත්තක්
3. ධීවර වෙළෙඳපොළක්/පදික වෙළෙඳුන්
4. නානතොටේ සොඳුරු කතාබහ

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. සරල සත්ත්ව හැඩතල භාවිතයෙන් චීත්ත රෙද්දක් මුද්‍රණය කිරීම සඳහා ව්‍යාප්ත මෝස්තරයක අඟල් **9 × 9** ප්‍රමාණයේ කොටසක් ඇඳ චමත්කාරයක් දනවන පරිදි වර්ණ කරන්න. මෝස්තර කොටස ව්‍යාප්ත වන අයුරු ගැන සැලකිලිමත් වන්න.

WWW.OLEVELAPI.COM

6. අඩි **8 × 6** ප්‍රමාණයේ ඇඳ ඇතිරිල්ලක් සඳහා මුලුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. බතික් ක්‍රමයට වර්ණ කළ හැකි පරිදි අඩි **4** ක් උස අඩි **2** ක් පළල බිත්ති සැරසිල්ලක් නර්තන විලාස දැක්වෙන මානව රූ **දෙකක්** ඇසුරෙන් නිර්මාණය කරන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. 'පුංචි සිත්තරා' නමින් පළවන ළමා පොතක් සඳහා පිට කවරයක් නිර්මාණය කරන්න.
9. "උගතමනා ශිල්පයමැයි මතු රැකෙනා" මැයෙන් අධ්‍යාපනයේ අගය පැහැදිලි වන සේ විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. 'අම්මා' පිළිබඳ ලියවුණු නිසඳැස් කාව්‍යයකට සුදුසු වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් සැලසුම් කරන්න.

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....